# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,516—1958 සැප්තැම්බර් 5 වැනි සිකුරාද—5.9.1958**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 759 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම් ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 759 | මාගී කොමිෂ් දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 761 |


## පළාත් පාලන නිවේදන

**1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදශී) අතුරු ව්‍යවස්ථා ආඥාපනත**

ඇල්.ජී.ඩී.—ජී අයි 11/2ඩී.

1952කේ අංක 6 දරන ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට ගන්දහය උතුර ගම් ප්‍රදේශයේ ගම්කායයී සභාව විසින් සම්මත කරගන්නාලද පහත දක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

යෝජනාව

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්දවූද, සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනලද බව 1953නේ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසැට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 12 වෙනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට පාත හේවාහැට ගන්දහයේ උතුර ගම්කායයී සභාව විසින් 1952 අංක 6 දරන ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ජේ. ඇම්. පී. ජයසිංහ,
(පාත හේවාහැට) ගන්දහය උතුර ගම් ප්‍රදේශයේ
ගම්කායයී සභාවේ සභාපති තැන.

වර්ෂ 1958ක්වූ පෙබරවාරි මස 28 වෙනි දින දීය.

## අතුරු ව්‍යවස්ථා

**ගම්සභා ආඥාපනත**

ජී.බී. 14/3/8.

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ ගාළු දිස්ත්‍රික්කයේ මාදම්පේ ගම්ප්‍රදේශයේ ගම්කායයී සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් 24 වෙනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිතවූ එකී වගන්තියේ (3) වෙනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමතකරනලද අතුරු ව්‍යවස්ථා.

වී. ඕ. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථාවර ලේකම්.

වර්ෂ 1958 අගෝස්තු මස 21වෙනි දින,
කොළඹ දීය.

අතුරු ව්‍යවස්ථාව

1955ශේ ඔක්තෝබර් 21 වෙනි දින අංක 10,850 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පහත දක්වෙන පරිදි මෙයින් සංශොධනය කරනු ලැබේ :—

(1) එහි 1 වෙනි ඡේදයේ " (ඇන්) රබර් ගබඩා කිරීම " යන කාරණය එක්කම ඊළඟට පහත සඳහන් අළුත් කාරණා යෙදීමෙනි:—

" (ඕ) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකිරීම.

(පී) පොල්ලෙලි පෙහවීම පිණිස පොල්ලෙලි කොටුවක් තබාගැනීම.

(කිව්) මිරිස් සහ වෙනත් කුළුපඩ වර්ග යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් ඇඹරීම ",

(2) එහි 2 වෙනි ඡේදයේ " (ආර්) කෙඳිවර්ග නෙලීම හෝ ගබඩාකිරීම " යන කාරණය එක්කම ඊලඟට පහත දක්වෙන අළුත් කාරණා යෙදීමෙනි :—

" (ඇස්) බයිසිකල් අළුත්වැඩියාකිරීම සඳහාවූ වැඩපොළක් තබාගැනීම.
(ටී) මෝටර් රථ අළුත්වැඩියාකිරීම සඳහාවූ වැඩපොළක් තබාගැනීම.
(යූ) අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කිරීම,
(වී) ගිණිපෙට්ටි සෑදීම.
(ඩබ්ලිව්) ගෘහ භාණ්ඩ සෑදීම, " හා

(3) එහි 3 වෙනි ඡේදයේ " (ඒ) කෙඳි සායම්කිරීම " යන කාරණය එක්කම ඊලඟට පහත දක්වෙන අළුත් කාරණා යෙදීමෙනි :—

" (බී) බැටරි චාජ් කිරීම:
(සී) හුණුගල් පිච්චීම, ගබඩාකිරීම, සකස්කිරීම හෝ කුඩා කැබලි වලට කැඩීම. "

---

ජීබී14/19/2.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ ගාළු දිස්ත්‍රික්කයේ ඕපාත ගම් ප්‍රදේශයේ ගම්කාය්‍ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පලවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාය්‍යාංශයේ වැඩ බලන ස්ථාවර ලේකම් තැන.

1958.8.21
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1940 අගෝස්තු මස 16 වෙනි දින අංක 8,651 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද සතුන් හා රථවාහන පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා ඊට යාකොට ඇති උපලේඛනය වෙනුවට පහත සඳහන් අළුත් උපලේඛනය යොදා මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" උපලේඛනය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින්රික්ෂෝ කරත්තයක් හැර වෙනත් ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | ඕපාත වා : |
| ඕනෑම අන්දමක සෑම ගොන් දෙන්නාබඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | ඕපාත බ : ක : |
| සෑම තනිගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | ඕපාත බා : ක : |
| සෑම ජින්රික්ෂෝ කරත්තයක් සඳහා ... | ඕපාත රි : |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | ඕපාත බ : |

රථවාහන තහඩුවල පාට, ප්‍රමාණය සහ හැඩය පිළිබඳව සභාපතිතුමා විසින් තීරණය කළ හැකිවන්නේය "

---

ඇල්ඩී—බී 47/40/ඇල්ජීඩී—ජීජ 11/60/5.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොල ගම් ප්‍රදේශයේ ගම්කාය්‍ය සභාව විසින් සම්පාදිතුව, 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන්, සංශොධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
වැඩ බලන පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ.

### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථාව

1. (1) ආඥපණතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි සඳහන් " ඒ " උපලේඛනයෙහි පෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධාන තුමාට යැවිය යුතුයි. මේ පෝර්ම ගම්කාය්‍ය සභා කාය්‍යාලයෙන් ලබා ගත හැක.

(2) ආඥපණතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වැනි වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් උප ලේඛනය සම්පූර්ණ කොට 1959 ජනවාරි මස 31 වැනි දින හෝ එයට මත්තෙන් ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිය හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නා වූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් එකී අය ගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලෙඛනය සැපයූවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව —

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු 31 වැනිද හෝ එයට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති ;

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරණ ලදුව, එකී වර්ෂයේ දවස් 30 ට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථ වාහන හා සතුන් සඳහා වූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු 31 වැනිද හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම්කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූ ද ආඥපනත යටතේ බද්දට යටත්වූ ද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කර ගෙන, තබා ගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත්කර ගැනීමේ හෝ තබා ගැනීමේ නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළත දී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති " ඒ " උපලේඛනයේ සඳහන් පෝරමයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කර ගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයූවාවූ සෑම අයෙක්ම, එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහා වූ බද්ද, ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනයේ හෝ (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළා වූ හෝ ලේඛනයේ සඳහන් කළා වූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිති වාසිකම් තියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිති වාසිකම් තියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසා යයි දක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමාට යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හල බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු විසින් ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් කොට ඇති " බී " උපලේඛනයෙහි දක්වෙන පරිදි ඒ ඒ රථවාහනය සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශෙෂ අකුරු ද තහඩුව නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම් ද රථවාහන රිජිස්ටරයේ ඒ ඒ රථවාහන තහඩු පිළිබඳ වූ අංකය ද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොසැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධාන තුමාට ආපසු භාර දිය යුතුයි. තවද ඔහු විසින් ගත පණහක් ගෙවූවිට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබාගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරා ගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සෑලැස්සුවහොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ගත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව, ඒ රථවාහනයේ කාටත් පෙණෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක්, ඒ රථවාහනයෙහි (7) වැනි අතුරු ව්‍යවස්ථා වෙහි ප්‍රකාර සවි කොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. කවද ප්‍රධාන තුමා විසින් හෝ එකී නිලධාරියා විසින් හෝ ඉල්ලීමක් කර සිටින කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩ දිය යුතුයි.

9. වර්ෂ 1940 ක්වූ අප්‍රේල් මස 26 වැනි දින අංකි 8,606 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද්දා වූ රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා, ඒවා අවලංගු කිරීමෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොල ගම්කාර්‍ය සභාවට පමණක් අදල වන පරිද්දෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල —

" ප්‍රධාන තුමා " යනුවෙන් ගම්කාර්‍ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ.

" කාර්‍ය සභාව " යනුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොල ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

" ආඥපනත " යනුවෙන් ගම්සභා ආඥපණත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

"ඒ" උපලේඛනය

පෝරමය

අංකය :

කොට්ඨාශයේ අංකය :

බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොල ගම්කාර්‍ය සභාව

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :

ගම :

තැපැල් :

| රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන වචනවලින් | වෙනත් විස්තර බයිසිකලයක් නම් එහි වර්ගය හා නොම්මරය සඳහන් කරනු |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන ... ... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල | | |
| තනිගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල ... | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ රථ ... ... | | |
| බයිසිකල් (සාදන ලද අයගේ අංකය සඳහන් කරනු) ... | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මෙහි ඉහත සඳහන් විස්තර සැම අතින්ම සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :————. අයිතිකාරයාගේ අත්සන : ————.

* අනවශ්‍ය වචන කපා හරිනු.

"බී" උපලේඛනය

පෝරමය

බර කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... ... රි : ග : ස : වා :

ඕනෑම අන්දමක සැම බර කරත්තයක් (ගොන් දෙන්නා බඳින) හෝ තිරික්කලයක් සඳහා ... රි : ග : ස : බ : ක :

සැම බර බාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... රි : ග : ස : බ : බා :

සැම ජින් රික්ෂෝ රථයක් සඳහා ... රි : ග : ස : රි :

සැම අත් කරත්තයක් සඳහා ... ... රි : ග : ස : අ : ක :

සැම බයිසිකලයක් සඳහා ... ... රි : ග : ස : බ :

# විවිධ දැන්වීම්

## මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 යේ වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පලිස්පත්තුව බටහිර ගම්කාර්‍ය සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය, තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත යටතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1957 තේ අංක 44 දරන ආඥපනතින් සංශෝධිත වූ අංක 6 දරන ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇස්. හලල්දීන් ... | නිකතැන්න, තෙල්දෙනිය ගම, තෙල්දෙනිය | හරක්මස් |

එච්. ඇම්. හේරත් බන්ඩා,
පලිස්පත්තුව බටහිර ගම්සභාපති තැන,

ගම්සභා කාර්‍යාලය,
නාරන්පනාව 28.8.58.

## විශේෂ නිවේදනයයි

1958 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, සැප්තැම්බර් මස හතර වැනි සතියේ ගැසට් පත්‍රය 1958 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරනු ලැබේ. ඒ හෙයින් එහි පළකිරීම සඳහා එවන නිවේදන සහ දැන්වීම් සැප්තැම්බර් මස 22 වැනි සඳුද පස්වරු 4 ට පෙර මෙම කාර්‍යාලයට ලැබෙන සේ එවිය යුතු බව කාගේත් දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

1958 සැප්තැම්බර් 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ 8.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශොධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වෙ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් **හෝ පළ කරණු නොලැබේ.**

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරණු නො ලැබේ.

10. **දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරණ ගාස්තු මෙසේයි :—**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දයක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශණ කායඹාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දයක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දයක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා | 15 | 0 |
| | 1වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| 1 වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. **පරණ** ගැසට් කොපි තිබෙනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශණ කායඹාංශයේ** අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී